**විසර්ජන ශීර්ෂය - 267**

-------------------------

**මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-----------------------------------

**විගණකාධිපති වාර්තාව - 2011**

----------------------------------

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අරමුණු**

------------------------------------------------

i. දිස්ත්‍රික්කයේ හා ප්‍රාදේශීයව ඉතා යහපත් ආකාරයෙන් පුරවැසි ප්‍රඥාප්තිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට.

ii. දිස්ත්‍රික්කයේ පරිපාලනය හා සංවර්ධනය සම්බන්ධීකරණය කිරීමේ ප්‍රධානියා බවට පත්වීමට.

iii. දිස්ත්‍රික් මට්ටමින් රාජ්‍ය සේවයේ ඵලදායීතාවය හා ගුණාත්මකබව ඉහල නැංවීම සඳහා රජයේ ප්‍රතිපත්ති හා පරිපාලන ව්‍යුහයන් වඩා යහපත් ක්‍රමයකට ක්‍රියාත්මක කිරීමට.

iv. විනිවිද භාවයෙන් යුත් අපක්ෂපාතී හා වගකිවයුතු රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමට .

v. කාර්ය මණ්ඩල ධාරිතාව ශක්තිමත් කිරීමට.

vi. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මූල්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමට.

vii. කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රාජ්‍ය පරිපාලන ක්‍රමයක් වැඩිදියුණු කිරීමට.

viii. දිස්ත්‍රික්කයේ පොදු ජනයාගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කාර්යක්ෂම සේවා බෙදාහැරීමක් සැපයීමට.

ix. රාජ්‍ය සේවයේ ඵලදායීතාවය හා ගුණාත්මක සේවය වැඩිදියුණු කිරීම සඳහා නවීන තොරතුරු තාක්ෂණය සමඟ සමස්ත සේවා හඳුන්වා දීමට.

x. ප්‍රධාන මූල්‍ය දර්ශක මැනීම සඳහා

xi. අමාත්‍යාංශ විසින් වගකීම පවරන ලද කටයුතු ක්‍රියාත්මක කිරීමට.

xii. රාජ්‍ය උත්සව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වීමට.

xiii. දිස්ත්‍රික් මට්ටමින් විදේශ අරමුදල් ව්‍යාපෘති සම්බන්ධීකරණය, අධීක්ෂණය හා සමාලොචනය කිරීමට.

xiv. අවදානම් කළමනාකරණය හා ආපදාවන්ට මුහුණදීම සඳහා පූර්ව සැලසුම් කටයුතු පිළියෙල කිරීමට.

xv. සම්පත් පිළිබඳ විධිමත් උපයෝජනය තහවුරු කිරීමට.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

---------------------------------------------------------------------

(අ) මරිටයිම්පත්තු

(ආ) ඔඩ්ඩුසුඩාන්

(ඇ) මන්තායි නැගෙනහිර

(ඈ) තුනුක්කායි

(ඉ) පුතුකුඩුඉරිප්පු

## 1.3 විගණනය හා විගණන විෂය පථය

-------------------------------------

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වු විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 මැයි 14 දින මුලතිව් දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරික්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂාකිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

-------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට හා රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වාගෙනයාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , කියාත්මක කිරීම සහ පවත්වාගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------------

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.136,125,000 ක් ව අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එයින් රු.133,507,483 ක මුදලක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ඉතිරි කිරීම් රු.2,617,517 ක් එනම් සයයට 1.92 ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | 2011 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 71,550,000 | 75,050,000 | 73,378,694 | 1,671,306 | 2.23 |
| මුලධන | 61,075,000 | 61,075,000 | 60,128,789 | 946,211 | 1.54 |
| එකතුව | 132,625,000 | 132,625,000 | 133,507,483 | 2,617,517 | 1.92 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලැබුණු ප්‍රතිපාදන උපයෝජනය**

---------------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත එකතුව රු.15,534,286 ක් වූ ප්‍රතිපාදන ලබාදුන් අතර එම ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ලැබුණු ප්‍රතිපාදනය | වියදම | 2011 දෙසැම්බර් 31 දිනට ඉතිරිය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 4,122,490 | 3,045,994 | 1,076,496 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 106,000 | 53,428 | 52,572 |
| ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 17,030 | 17,030 | - |
| ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 102,000 | - | 102,000 |
| පරිසර අමාත්‍යාංශය | 535,000 | 527,400 | 7,600 |
| රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 1,522,000 | 1,423,634 | 98,366 |
| රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 1,788,429 | 1,784,768 | 3,661 |
| ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 731,263 | 685,412 | 45,851 |
| ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 4,635,604 | 2,272,663 | 2,362,941 |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 304,470 | 295,233 | 9,237 |
| රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව | 1,670,000 | 1,528,454 | 141,546 |
| එකතුව | 15,534,286 | 11,634,016 | 3,900,270 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

විෂය අංක 26701 යටතේ පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සීමා හා තථ්‍ය ප්‍රමාණයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 10,676,000 | 10,645,770 | 2,800,000 | 7,606,179 | 38,000,000 | 26,388,083 |

2.3 **අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්**

--------------------------------

(අ) **අග්‍රිම ගිණුම්**

-------------

2011 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අග්‍රිම හර ශේෂය රු.2,333,661 ක් විය.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම් ශේෂය රු.17,249,353 ක් විය. විස්තර පහත දැක්වේ.

| **ගිණුම් අංකය** | **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. |
| 6003/0/0/43/0 | 17,249,353 |

2.4 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය**

----------------------------------------------------------

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙම වාර්තාවේ (අ) සිට (ඊ) දක්වා වූ පොදු නරීක්ෂණ සහ 2.5 සිට 2.9 දක්වා වූ ඡේදවල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණවලින් ඇතිවන බලපෑම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

(අ) **පොත් හා වාර්තා පවත්වා නොගැනීම**

-----------------------------------

(i) දිසත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබූ අතර වෙනත් සමහර ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මෙම ලේඛන පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | පරිගණක , උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | |
| (ඇ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | |
| (ඈ) | පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 | |

(i) රු.36,639 ක් වු ගෙවීම් ලදුපත් , රු.882,516 ක් සඳහා පොලිස් වාර්තා , රු.2,333,661 ක්වූ හානි පිළිබඳ විස්තර හා විස්තරාත්මක උපලේඛන නොමැතිවීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එකතුව රු.3,252,816 ක්වූ ගනුදෙනු 11 ක් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**(ආ) අයවැය විචලනය**

------------------

වැය විෂය 1-1-0-1404 යටතේ ප්‍රතිපාදනය කරන ලද රු.50,000 ක සමස්ත ශුද්ධ ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

**(ඇ) වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

-------------------------------

රාජ්‍ය මුල්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන ලිපියට අනුව දිස්ත්‍රික් ලේකම් විසින් 2010 වර්ෂය සඳහා හා ඉදිරි වර්ෂ සඳහා රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු ක්‍රියාකාර සැලැස්ම 2011 දෙසැම්බර් 31 දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

2006 මාර්තු 31 දිනැති අංක 128 දරන අයවැය චක්‍රලේඛයට අනුව 2011 දෙසැම්බර් 31 දක්වා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

(අ) වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවූ රු.2,344,090 ක හිමිකම් නොපෑ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ආනන්දපුරම් කාන්තා ගාම සංවර්ධන සමිතියේ සභාපතිට වෙන්කරන ලද රු.492,419 ක තැන්පතු 2012 මැයි 08 දිනය දක්වා උපයෝජනය කර නොතිබුණි.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

2011 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශයට අනුව 2011 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවතුණු ශේෂ එකතුව රු.296,963 ක් වූ අතර එම හිඟ ශේෂ අයකරගැනීම පිළිබඳ පසුවිපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලන් වාර්තා කරන ලද අතිරික්තතා හා ඌනතා සහ කරන ලද වෙනත් නිර්දේශයන් පිළිබඳව මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) ග්‍රාම සේවා කාර්යාල 102 ක් සම්බන්ධයෙන් 2011 වර්ෂය හා පෙර වර්ෂ සඳහා භාණ්ඩ සමීක්ෂණ මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව පවත්වා නොතිබුණි.

## 2.6 අනුකූල නොවීම්

**(අ) නීති , රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති , රීති , හා රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූල නොවීමේ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | **නීති , රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **මුදල් රෙගුලාසි** | | |
| | මුදල් රෙගුලාසි අංක 103(ආ) | 202,618 | අනතුරක් පිළිබඳව පොලිසියට වාර්තාකර නොතිබුණි. |
| **(ආ)** | **චක්‍රලේඛ විධිවිධාන** | | |
| | <u>**භාණ්ඩාගාර චක්‍රලේඛ**</u> | | |
| | (i) 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | 2011 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත්කර නොතිබුණි. |
| | (ii) 2006 මාර්තු 24 දිනැති අංක 28 දරන ජාතික අයවැය චක්‍රලේඛය | - | 2011 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| | (iii) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (iv) 1999 අප්‍රේල් 1/99 දරන මහාභාණ්ඩාගාර චක්‍රලේඛය | - | මුදල් සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරින්ගෙන් ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |

**(ආ)** **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව මිලදී ගැනීම්වලින් රු.182,091 ක් වූ රඳවා ගැනීම් බදු අයකරගෙන නොතිබුණි.

## 2.7 පාඩු හා හානි

විගණන නියැදි පරීක්ෂණවලදී හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා තිබුණු තොරතුරු අනුව රු.882,516 ක් වටිනාකම ව පාඩු හා හානි අනාවරණය විය.

**2.8 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------

2011 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 05 | 01 |
| තෘතියික මට්ටම | 02 | නැත | 02 |
| ද්විතීයික මට්ටම | 26 | 18 | 08 |
| ප්‍රාථමික මට්ටම | 12 | 08 | 04 |
| එකතුව | 46 | 31 | 15 |

**2.9 අභ්‍යන්තර පාලනය**

--------------------

**(අ) අභ්‍යන්තර විගණනය**

----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කිසිදු අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**(ආ) විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

------------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 විසින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු විගණන හා කළමනාකරණ කමිටුවක් පවත්වා නොතිබුණි.